# රචනය

අ.පො.ස (සා.පෙ) විභාගය II ප්‍රශ්න පත්‍රයේ 02 ප්‍රශ්නය රචනයයි. මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා ලකුණු 25 ක් ඔබට හිමි වේ. රචනා මාර්ගෝපදේශ 04ක් ලබා දෙන අතර එයින් ඔබට ලිවීමට පහසුම රචනා මාර්ගෝපදේශය තෝරා ගෙන අදාළ රචනය ලිවිය යුතු ය. තෝරා ගත් මාර්ගෝපදේශයට අදාල ව රචනා සැකිල්ලක් සකසා ගෙන ඒ ඔස්සේ ඔබේ රචනය ලියුවහොත් මාතෘකාවට අදාලව සාර්ථක රචනයක් නිර්මාණය කළ හැකි ය.

## රචනයට ලකුණු දෙන පිළිවෙල

01 සාරවත්භාවය මාතෘකාව ද ඇතුළුව - ලකුණු 08

(සාරවත්භාවය ලකුණු 07)

(මාතෘකාව ලකුණු 01)

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීපබව, සරුබව හා සමබව, වචන ගණන 250 ට සමීපව පැවතීම යන කරුණු මීට අයත් වේ.

02 සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12

මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංග ගැන සලකා බැලේ.

03 ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම - ලකුණු 05

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට තිබීම යන අංශ ගැන සලකා බැලේ.

❖ පහත රචනා මාර්ගෝපදේශ සියල්ලට ම රචනා ලියන්න.

1. දරුවාගේ ආරක්ෂාව, දැනුම හා දියුණුව සැලසීමට වැඩිහිටියෝ දිවා රෑ වෙහෙසෙති. වැඩිහිටියන් වයස්ගත වූ පසු නිවෙස්වල ම රඳවා ඇප උපස්ථාන කිරීම දරුවන්ගේ වගකීමකි. එහෙත් දිනෙන් දින බිහිවන වැඩිහිටි නිවාස දෙස බලන විට මේ වගකීම සමාජයෙන් ගිලිහී යමින් පවතින බව පෙනේ. වයස්ගත නැදෑයෝ මෙම වැඩිහිටි නිවාසවලට කොටු වී අසරණ ලෙස ජීවත් වෙති. මේ නිසා වැඩිහිටියන් නිවෙස්වල ම රඳවාගෙන ඔවුන් ආදරයෙන් රැක බලා ගැනීම සමාජයේ වගකීමකි.

2. මිනිස්සු වනාන්තරයෙන් තම අවශ්‍යතා සපුරා ගනිති. අළි ආහාර සොයා ගම් වදිති. වනාන්තර එළිපෙහෙළි කරමින් පෞද්ගලික අවශ්‍යතා ඉටු කර ගැනීමට මිනිස්සු නිතරම උත්සාහ කරති. අළි

ඇතුන් මිනිසාට ප්‍රශ්නයක් වි ඇත්තේ මේ නිසා ය. මේ ගැටළුවට තිරසාර විසඳුම් නොමැති වුවහොත් සුන්දර පරිසරය හා සත්ත්ව ප්‍රජාව අපට සදහට ම අහිමිව යනු ඇත.

3. අප පරිසර පද්ධතීන් අතර සමුද්‍රීය පරිසර පද්ධතිය සුවිශේෂී ස්ථානයක් ගනී. මත්ස්‍ය සම්පත, මුහුදු පැළෑටි, කොරල් පර ආදිය මෙහි විශේෂයෙන් දක්නට ලැබේ. වර්තමානයේ විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා සමුද්‍රීය පරිසර පද්ධතිය විනාශයට ලක්වෙමින් පවතී. විශේෂයෙන් නාවික ගමනාගමනයේ දී සිදුවන විවිිධ අනතුරු මෙය වඩා තීව්‍ර කරයි. සමුද්‍රීය පරිසර පදිධතීන් ආරක්ෂා කිරීමට ජගත් අවධානය යොමු කළ යුතු කාලය එළඹ තිබේ.

4. උසස් පෙළ විභාගය සමත් වූ පසු තවදුරටත් ඉගෙනගැනීමට ශක්තියක් මා තුළ නොවීය. පියා නොමැති වීමත් අධික දිළිඳුබවත් මාගේ අනාගතය අවුරන සාධකයන් බඳු විය. මම කල්පනා කරන්නට වීමි. අක්කර දෙකක පමණ අපේ වත්ත මාගේ මතකයට අවේ නැවුම් බලාපොරොත්තු ඇතිවය. මම එය දැඩි ලෙස සිතට ගත්තෙමි.